# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2420/60 - 2025 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2025.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/PJP/4/4/2/W/91.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2021/WS/335.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 521 ගොඩහේන ග්‍රාම නිලධාරි වසමට අයත් ගොඩහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද 2024.10.16 වැනි දිනැති අංක 321215 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 1, 2 වශයෙන් දැක්වෙන ගොඩහේන වත්ත නැමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0174 (පර්චස් 6.9) ක් පමණ වන පහත සඳහන් මායිම්වල පිහිටි ඉඩම් කොටස් දෙක :

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: ගොඩහේන වත්ත: ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර 0.0032 (පර්චස් 1.3)

ඉඩමේ මායිම් :

උතුර : මුපි A 2054 හි කැබලි අංක 115; නැගෙනහිර : මුපි A 2054 හි කැබලි අංක 115, 132 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; දකුණ : කැබලි අංක 2 සහ මුපි A 2054 හි කැබලි අංක 132, 115; බටහිර : මුපි A 2054 හි කැබලි අංක 115

හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් -

1. ඩබ්. එම්. ලොකු මැණිකේ මහත්මිය, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
2. ඩබ්. එම්. ටිකිරි බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
3. ඩබ්. එම්. රණසිංහ බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
4. ඩබ්. එම්. හේරත් බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.

**02. කැබලි අංක 02**
ඉඩමේ නම: ගොඩහේන වත්ත: ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර 0.0142 (පර්චස් 5.6)

ඉඩමේ මායිම් :

උතුර : කැබලි අංක 1 සහ මුපි A 2054 හි කැබලි අංක 115; නැගෙනහිර : මුපි A 2054 හි කැබලි අංක 115 සහ 132; දකුණ : මුපි A 2054 හි කැබලි අංක 132; බටහිර : මුපි A 2054 හි කැබලි අංක 132 සහ 115

හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් -

1. ඩබ්. එම්. ලොකු මැණිකේ මහත්මිය, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
2. ඩබ්. එම්. ටිකිරි බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
3. ඩබ්. එම්. රණසිංහ බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.
4. ඩබ්. එම්. හේරත් බණ්ඩා මහතා, අංක 132, ගොඩහේන, දොලපිහිල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 මාර්තු මස 19 වැනි දින පෙ.ව. 10.00 ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025 මාර්තු මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**ඩී. එම්. එස්. කේ. දීගල,**
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2025 ජනවාරි මස 22 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 01 - 0243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.